

## පැමිණි දුක්

පැමිණි දුක් අම රසයි කියමින්
සිතම සිත රැවටුවද රහසින්
අතිරසත් තිත්තව දැනෙන සඳ
අරළු බුළු ගැන කියනු කවරෙද?

අරුත් සුන් බව සිතට දැනුනද
යලිත් සුවයක් සෙවූ මොහොතක
උපැස් යුවලක් තුලින් බැළු මුත්
අදත් ලෝකය යටිකුරුව ඇත

සොහොන් කොත මත තවත් වරකට
හදක් ගල්වුනු වෙලාවේ
අපේ පාළුව උහුල ගමු අපි
ඉදින් සිත හුදකලාවේ

**රසිකා පෙරේරා**

## ප්‍රහේලිකාව

ලොවේ සියලු - දුක් දොම්නස්
මැද සැනසු - ආදරයයි

ලොවේ සියලු - සැනසුම මැද
දුක දොම්නස - ආදරයයි

**රනුක චන්ද්‍රසූරිය**

## පියාණනි

මෑණියන් සමඟ මෙන්
නිදහසේ ඔබ සමඟ
ජීවිතයේ බොහෝ දේ
තෙපලූයේ නැති වුවත්,

ඔබෙන් මට සිදි වූ
මෙහෙවර මෙපමණකැයි
නිමාවක් කරන්නට
නොහැකි යැයි මට සිතේ.

නිහඬ ඔබෙ දෙනෙත්හි
රැඳී ඇති දහසකුත් හැඟුමන්
කෙසේ දැයි කියාලා
හඳුනන්නට හැකියාවක් මට ඇතේ.

එලෙස සංවේදී වන්නට
මං හෙළි කළ
පියාණන් ට
පුදමි මගේ උපහාරය.

**කාන්ති ජයසිංහ**

## චින්තන උදාන

පොදු රද මඬුලු මෙල්බන් පුර තරඟ    බිමේ
දස මහ යෝද බල මහිමය ඇතිව    ලැමේ
අබිමානවත් බව සිරිලක    කියන    නමේ
ඔසවා තැබුවයි සිංහල පුතකු    ගමේ

ජය පැරදුමට සම ලෙස මදහස    පාන
එඩිතර ගතිය ලැබ දී ඇත    ජයපාන
දැඩි අදිටනින් ජයගත් රන්    කූසලාන
පෙන්විය ලොවට පුලතිසි පුර    අබිමාන

ඔබ ලද විජය දැයටම ලද    ප්‍රදානයයි
ඔබ නම ජගත් පිටියට නව    උදානයයි
ඔබ චින්තනය රටකට දෙන    විදානයයි
ඔබ වැනි පුතුන් ලක්මව ලද    නිදානයයි

**ජගත් වෙත්තසිංහ**
ක්රේගිබර්න්




## අම්මා නැති අපි

වත්ත පහල පන් කොටුවේ
මැදින් ගලන දිය පාරේ
අයියන්ඩියෙ නුඹයි මමයි
සෙල්ලම් කල හැටි මතකද

මල් ගවුමේ රැළි සායට
හඳයො පැටව් අල්ලාගෙන
ඇගේ වතුර බේරි බේරි
ගෙදර දිව්ව හැටි මතකද

මග නැවතී හති හල හල
වතුර හිඳුණ මල් ගවුමේ
මාළු පැටව් නැටූ නැටුම්
දැක හිනැහුණ හැටි මතකද

වතුර නැතිව හඳයො මැරෙයි
උන්ගෙ අම්ම උන්ව හොයයි
ගොස් ආපහු ඇරලන්නයි
අම්ම කීව හැටි මතකද

ඉර හඳ මල් පාට පාට
අච්චර ලස්සන උනාට
ඈ නැති ලොව අඳුරු පාට
අම්ම කීවෙ නැත්තෙ මොකද

**ප්‍රියා කුමාරසිංහ**

## බාල විය

අතකින් අල්ලගෙන උඩයන    සරුංගලේ
දිවූ හැටි මතක්වෙයි ඉපනැලි අතර    වෙලේ
අද වැඩිහිටියෙකු වුවත් ගිය මුහුකුරා    මොලේ
නිතරම සිතින් පිවිසෙමි දිවියට    බාලේ

ඇණයක් ගසාගෙන පොල්ලක එක    කොනක
පැදවූවා රෝදෙ හඬදී    කාරයක
අද හිමියෙකු වුවත් නවතම    වාහනෙක
සතුටක් කොයිද මා විදි බාලේ    දිනෙක

ගේ ලඟ වනරොදට හොර රහසේ    රිංගා
මාදම්, පේර, හිඹුටුත් කැවෙමි    හංගා
ලේනුන්, කුරුල්ලන් හඬමින් ගස්    නැංගා
දිවියෙහි හොඳම කාලයෙ සිරි මම    දැක්කා

යනවිට වැඩට හිම කැටි වැටෙනා    උදයේ
සතුක් කොයිද පිටරට ගෙවනා    දිවියේ
බොල් පිණි වැටී හිරු පායා එන    උදයේ
කොතරම් සතුටින්ද මා පාසැලට    ගියේ

අම්මගෙ උකුලෙ හිද ආයෙත්    නැලවෙන්න
අක්කා එක්ක උදයේ පාසැල්    යන්න
මිතුරන් සමඟ ඔය දියඹේ    පිහිනන්න
හැකිනම් බාල විය ආයෙත්    ලැබගන්න

**සරත් වීරසේකර**
කැනඩාව
ටොරොන්ටෝ නගරයේදී.

## සාප නොලද ගැහැණිය

අඳුරු මං මාවත් පෙත් තුළ
සුවිසල් මැඳුරු තුළ
සිරියහන් මල් ඇතිරිළි මැද
නිල් තිර වට රැඳි
කණා මැදිරි එළි රැඳි
පහන් දැල්වෙන රාත්‍රියේ
වත්සුණු ඇඟ හැඩගන්වා
විළවුන් ගත මත අතුරා
අඩකය පෙන්වා රඟ දෙන
නිරුවතට ආරාධනා කරන
මධු විත රැඳි දෙතොලින්
අනුරාගයේ දෙනෙතින්
කාමයේ උන්මාදයෙන්
කිමිද බදු දෙන්නේ
ඔබෙ ගත අබිසරු ලියේ
යුක්තිය නීතිය අඩ අඳුරේ ඇති
සමාජයට ඔබ පිළිලයකි
ලොවට නිගරුවකි
එහෙත් ලියේ අභිසරු
ඔබ පහස ලැබුවේ කවුරුන්දෝ
සපා විනාශ කළේ කවුරුන්දෝ
මී විත උරා බීවේ කවුරුන්දෝ
කියනු මැන ලොවට හඬ ගා
ගත විකුණා ඔබ ගත් කහවනුවෙන්
රැක්කේ ඔබෙ ආත්මය ද?
දෙපා අහිමි හිමි සඳුන් ද?

ඔබ වටහා ගත් කිසිවකු නැත
සරණක් දුන් කෙනෙකුදු නැත
ළඳුනි ඔබ විනාශ කළ
පාපයට ඇද දැමූ
සුවඳ මල් තලා දැමූ
අත් තටු සිඳ බිඳ දැමූ
ඒ අධම සළෙළුන්ට
මුග්ධ තිරිසනුන්ට
පව් සේදීමට හැකි නම්
කරන්නම් සාප
තවත් ගැහැණියක සේ



***කාන්ති වික්‍රමසූරිය***

## සිවුරු හළ හිමිට.

නුගුණ නොම සොයමි හිමි සඳුනි ඔබේ
කුළුණු ගුණ දකිමි සියොළඟ දිවා රැයේ
ගෙදර බුදු කුටිය අස යදිනා යැදුම් ඇසේ
හතර පේරුවේ නොදුවන් සිත සඳුනේ

සසර දිග පළල බලමින් රෑ කි සීලේ
ගම් දනව් සිසාරා විහිදුන සීල ගුණේ
මගෙ කුණු කයට ලොල්වුණ ඔබ බව කරුමේ
වල් අලි දමාවත් යළි ඇදිය නොහේ.

හතර වට හඬන දරුවෝ හතර දෙන
නොසිතන් සතර පෙර නිමිතිය යළි වලට යන
යශෝදරා නම් නොවෙමි පව්කාර මාගම
යන්නට නොදෙමි තපසට බවුන් වඩනට

ඇත්දළ සුදුපාට කහපාට සිවුරට
විහඟසර බණට නිසසල ඇස්දෙකට
දහසක් දෙන වඳින ඔබ තුඟු රන් බඳට
වසඟ වුනේ මම මගෙ පෙර පවට

අනඟි කොමළ පා යුග රිදෙනා බව දනිමි
කටුසර හේන ගොවිතැන් බැරිබව දනිමි
අව්වේ තියෙන රැස් රන් බඳ කලු කරති
ලබන බවේ මම ඔබ නිදහස් කරමි

උදේ දවල් රෑ තුන්යම නොවෙනස්ව
අගසස් දනක් සේ මේ ගත පුදමි මම
දවා සපා හලු කළ මැන තුණු රූපත් සිරුර
අනුමෝදන් වෙමි එපින් ඔබටත් දෙමින.

**චන්ද්‍රරත්න බණ්ඩාර**

## අවුරුද්දෙ අඩුවක්

සීතල සුළඟක් ඒවිද කෙදිනක සිසිලක් සුවයක් එකට    අනා
ඉඩෝරයේ සරතැස දාහය මැද දුක්වෙන කල ලොව සියළු    දෙනා
එක පදයක් අඩු කවියක් වාගේ තව නව වසරක් උදා    වුනා

ගතානුගතිකවු එරබදු මල් සහ කොහෝ කුරුළු නාදය    තිබුනා
රතිඤ්ඤ සද්දේ කැවුම් කොකිස් සහ ක්‍රිකට් සමග අවුරුදු    ලැබුනා
ඒත් මොකක්දැයි හිතාගන්න බැරි අඩුවක් ඒ මැද්දෙන්    එබුනා

ලැබූ නව වසරේ' දාහය නිවනා සීතල වා රෑ ළි    හමන්නයි
සිරීපොද වැසි මැද පිචච සමන් මල් සුවඳ විහිදමින්    පිපෙන්නයි
පද හතරක කවියක් සේ අඩු නැති සුභ නව වසරක්    ලබන්නයි

**රසික සූරියආරච්චි**



## සමුදුර

සුමුදු පෙන පොදියක් ව
ගලා යන දිය දහර
වරෙක රුදුව... සැඩව...
ගලා විත්..
බිලි ගනී.. මිනිස් කැල..
පෙන පිඬු ගලා විත්
සිඹින විට වැලි තලය...
කෙසේ සැක හැර ගනිම් ද
ඔබ .. රළ පහර..
නොවන බව..
තවත් සුනාමියක්..

**රමණී පෙරේරා**
බන්ඩුරා වික්ටෝරියා

## දෙමඟක්

තක්ෂිලාවෙ ශිල්ප දහර
උස්පච්චේ බිඳුනු විවර
අතර මැදින් ඇද හැලෙනා
ඝෝර හඬට කන් බිහිරිව
දෑස දකින අඳුරු පතුල
කැලුම් දැනී ගත සිසිලව
බියපත් වන දිය කඩිත්ත
ඉවත දමා අභියෝගය
අහක ගලා වල් මත් වෙයි

පෙර මඟ ගත් එඩිතර දිය
සේද සිනිඳු සලුව තනා
පහත වැටී බිංදු ලෙසට
සැහැල්ලුවෙන් කය බර ගෙන
තැන්පත් වී උන්නු ලෙසට
චමත්කාරයේ ලකුණින්
ඇල්ල තනා පහන දිවෙන
දැනුම දිනු දැනුවත් ගඟ
රළු ගල් පර ඔපවත් කර
සැඟව තිබෙන වැලි අතරින්
නිල් මිණි කැට එලියට දෙයි

**ප්‍රේමසිරි ගුණතිලක** සිඩ්නි

සාදර අනුග්‍රහය
Disney Maintenance
DM
INDUSTRIAL
COMMERCIAL
DOMESTIC
CARPET STEAM CLEANING - HARD FLOOR CLEANING & SEALING
Disney Maintenance
Rohan Tel: 03 9792 0656 Mob: 0408 106 022